පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන,
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

சுற்றாடல், வனசீவராசிகள், வனவளங்கள், நீர்வழங்கல்,
பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

Ministry of Environment, Wildlife, Forest Resources, Water Supply,
Plantation and Community Infrastructure.

ජල සම්පත් මණ්ඩලය
நீர் வளச் சபை
WATER RESOURCES BOARD

මගේ අංකය / எனது இல / My No: DGM(R&D)/GRU/GEN/2024
ඔබේ අංකය / உமது இல / Your ref.: .....
දිනය / திகதி / Date.: 2024.11. 07

ජල සම්පත් මණ්ඩල චක්‍රලේඛ 01/2024

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත සංස්ථා මණ්ඩල ප්‍රධානීන්,

ගැඹුරු නල ළිඳක් ඉදිකිරීමේදී හා භූ ගත ජලය උකහා ගැනීමේදී, 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත හා අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුගමනය කල යුතු ක්‍රමවේදය

1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනතේ 12 (අ) වගන්තිය අනුව හා අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව දීප ව්‍යාප්තව සිදු කරනු ලබන නල ළිං හා භූගත ජලය උකහාගැනීම නියාමනය කරන කාර්යභාරය ජල සම්පත් මණ්ඩලය වෙත පැවරී ඇත. මීට පෙර නල ලිඳක් ඉදිකිරීම සඳහා හඳුන්වාදී ඇති ක්‍රමවේදය තව දුරටත් ක්‍රමවත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කල යුතුවේ.

1. නල ළිඳක් ඉදි කිරීම සඳහා අවශ්‍යතාවය සහතික කර ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු "ගැඹුරු නල ළිං ඉදිකර ගැනීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම් පත්‍රය" (WRB: Form 01) නිසි පරිදි සම්පූර්ණ කිරීම (ඇමුණුම 1).

එම පෝරමය(ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය) ඉදිරිපත්කිරීමේදී පහත පරිදි කටයුතු කල යුතුවේ.

i. අයදුම්කරුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ආකෘතියේ අංක 1 කොටස පිරවිය යුතුය.
ii. නල ළිඳ ඉදිකිරීමට යෝජිත ස්ථානයෙහි/ ඉඩමෙහි තොරතුරු ලබා දීම සඳහා අංක 2 කොටස පිරවිය යුතුය
iii. නල ළිඳ ඉදිකිරීමේ අරමුණ සහ දළ ජල අවශ්‍යතාවය අංක 3 කොටසෙහි සඳහන් කල යුතුය.

iv. ඉදිරිපත් කල නොරතුරු ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් මගින් අංක 4 කොටසේ සහතික කල යුතුය. එහිදී, එම නල ළිඳ ඉදිකිරීම සම්බන්ධයෙන් අසල්වාසීන්ගේ විරෝධතාවයක් ඇත්නම් හෝ නල ළිඳ ඉදිකරන භූමියෙහි හිමිකාරිත්වය වෙනත් පුද්ගලයෙකුට හෝ රජයට අයත්නම් ඒ පිළිබඳව අංක 4 කොටසේ ග්‍රාම නිලධාරී නිල මුද්‍රාවට ඉහලින් ඇති කොටුව තුල ග්‍රාම නිලධාරී විසින් සඳහන් කලයුතුය.

2. නල ළිඳ ඉදිකිරීමට යෝජිත භූමිය කඳු ආශ්‍රිතව පවතින නායයෑමේ අවධානමක් ඇති ප්‍රදේශයක්නම් ඒ පිළිබඳව ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය මගින් නිසි අවසරයක් ලබා ගත යුතු අතර යෝජිත භූමිය පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශයක් තුල පවතීනම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් අදාළ ඉදිකිරීම සඳහා නිසි අවසරයක් ලබාගත යුතුය. එමෙන්ම නල ළිඳ ඉදිකිරීමට යෝජිත භූමිය රජයේ භූමියක හෝ රක්ෂිත ප්‍රදේශයක පවතීනම් අදාළ ඉදිකිරීමට එම ආයතන මගින් ලබාගත් අනුමැතිය ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

3. අදාල ඉල්ලුම් පත්‍රය සහතික කර ගැනීමෙන් පසු භූගත ජලය ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමෙහි නල ළිඳ ඉදිකර ගැනීමට වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීම සඳහා භූජල විද්‍යා සමීක්ෂණයක් සිදු කරගත යුතුය. එමගින්,

   i. අදාළ ඉඩම තුල නල ළිඳක් ඉදිකිරීමට ඇති හැකියාව තීරණය කිරීම
   ii. නල ළිඳ ඉදිකල යුතු ආකාරය (උදා: නල ළිඳ ඉදිකල යුතු නිවැරැදි ස්ථානය, යෙදිය යුතු PVC ගැඹුර, නල ළිඳ ඉදිකල යුතු ගැඹුර ආදී තාක්ෂණික නොරතුරු)
   iii. අවට පවතින ළිං වලට ගැටළු ඇති නොවන පරිදි නල ළිඳ ඉදි කර ගැනීමේ හැකියාව හදුනා ගැනීම සිදු වේ.

   අදාල භූජල සමීක්ෂණ කටයුත්ත ජල සම්පත් මණ්ඩලය මගින් සිදුකරගත යුතුය. එමෙන්ම අදාළ වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති භාහිර භූජල විද්‍යාඥයින් මගින් සිදුකර ගැනීමේ හැකියාවද පවතී. ලියාපදිංචි භූ ජල විද්‍යාඥයින්ගේ ලැයිස්තුව ජල සම්පත් මණ්ඩලයේ වෙබ් අඩවියෙන් ලබාගත හැක (https: /wrb.lk tubewell-construction-procedures/)

4. එසේ සිදුකරන ලද භූජල සමීක්ෂණ වාර්තාව හා ප්‍රාදේශීය ලේකම් මගින් සහතික කරගත් ඉල්ලුම් පත්‍රය (අංක 5 කොටස සමීක්ෂණය සිදුකල භූජල විද්‍යාඥවරයෙකුගේ නිර්දේශ හා අත්සන සහිතව) ජල සම්පත් මණ්ඩලයයේ නියාමන ඒකකය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුවේ.

5. ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි භාහිර භූජල විද්‍යාඥයින් මගින් සිදුකරන භූජල සමීක්ෂණ කටයුතුවලට අදාළ වාර්තාවලට අදාලව යොමුකරන ඉල්ලුම් පත්‍රයේ අංක 4 කොටසේ, මෙම නල ළිඳ ඉදිකිරීම සම්බන්ධයෙන් මහජනතාවගේ විරෝධතා ඇති බවට සඳහන්ව ඇත්නම් එම විරෝධතා පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ජල සම්පත් මණ්ඩලය මගින් කටයුතු සිදුකරන අතර ඒ සඳහා වන වියදම් අදාළ නල ළිඳ ඉල්ලුම්කරු විසින් දැරිය යුතුය. කෙසේ වෙතත් නල ළිඳ සඳහා ස්ථානීය පරීක්ෂාව ජල සම්පත් මණ්ඩලය මගින් සිදුකරනු ලබන්නේනම් අදාළ පරීක්ෂණ කටයුතුවලට සමගාමීව එම විරෝධතා පිළිබඳව පරීක්ෂණ කටයුතුද සිදු කල යුතුය.

6. අදාළ පරීක්ෂණ කටයුතු සිදුකිරීමෙන් අනතුරුව නල ළිඳ ඉදිකිරීමේ කටයුතු භූජල සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා ජල සම්පත් මණ්ඩලයේ නිර්දේශ වලට යටත්ව ජල සම්පත් මණ්ඩලය මඟින් හෝ අදාළ වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති භාහිර විදුම් ආයතනයක් මඟින් හෝ නිසි ප්‍රමිතියට අනුව ඉදිකරගත යුතුය. නල ළිඳ භාහිර විදුම් ආයතනයක් මගින් ඉදිකරන්නේ නම් ඒ සඳහා GRU-09 (ඇමුණුම 2) පෝරමය නිසි පරිදි සම්පූර්ණකර ජල සම්පත් මණ්ඩලයේ නියාමන ඒකකය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වේ. එසේම නල ළිඳ ඉදිකිරීමෙන් අනතුරුව මෙම නළ ලිඳෙහි නිමි වාර්තාවක් නල ලිඳේ ඉල්ලුම්කරු විසින්

අදාල නල ළිං විදුම් ආයතනය මගින් ලබාගත යුතු අතර එහි පිටපතක් ජල සම්පත් මණ්ඩලය වෙත එවිය යුතුය.

7. ඉදිකරන ලද නල ළිදෙහි ජලය වාණිජමය හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනු ලබන්නේ නම් නල ළිදෙන් ගත හැකි ආරක්ෂිත ජල ප්‍රමාණය (දීර්ඝකාලීනව ජලය ලබාගැනීමේදී භූගත ජලධරයන්ට හා අවට පිහිටි භූගත ජල මූලාශ්‍රවලට හානියක් නොවන පරිදි ලබාගත හැකි ජල ප්‍රමාණය) නිර්ණය කිරීම සඳහා අනිවාර්යයෙන් ජල ධාරිතා පරීක්ෂණයක් ජල සම්පත් මණ්ඩලය මගින් සිදුකර ගත යුතුය.

8. වාණිජමය කටයුතු සඳහා භූගත ජලය භාවිතා කරන ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු අතර දෛනිකව ලබාගන්නා ජල ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා අදාළ ජල මූලාශ්‍ර සඳහා ජලමිණුම (Flow Meter) ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සවිකල යුතුය. ඒ මගින් අදාල ජල මූලාශ්‍රය මගින් දෛනිකව ලබාගන්නා ජල ප්‍රමාණයන් පිළිබඳව තොරතුරු ඇතුලත් ලේඛනයක් පවත්වාගෙන යායුතු අතර අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂා කිරීම සඳහා මෙය ඉදිරිපත් කල යුතුය.

9. තවද, ජල බෝතල් හා බීම බෝතල් නිෂ්පාදනයේ යෙදී සිටින සියළුම ආයතන හෝ පුද්ගලයන් අදාළ ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරගත යුතු අතර එහි රසායනික විශ්ලේෂණ වාර්තාවක් සෑම මාස 6 කට වරක් ජල සම්පත් මණ්ඩලය වෙත ගුණාත්මකභාවයේ වෙනස්කම් පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා එවිය යුතුය.

10. ඉහත උපදෙස්වලින් පරිබාහිරව ඉදිකරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන නළ ළිං 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත හා අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට් ඒන්ත්‍රය අනුව නීතියට අනුකූල නොවන නළ ළිං ලෙස සලකනු ලබන අතර එවැනි නළ ළිං සම්බන්ධව නීතිමය කටයුත්තකදී හෝ වෙනයම් ගැටළුවකදී ජල සම්පත් මණ්ඩලය වග කියනු නොලැබේ.

මෙම චක්‍රලේඛය ජල සම්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි නිකුත් කරන ලදී.

ටී.එච්.බී.ඒ.දේශප්‍රිය
වැ. බ සාමාන්‍යාධිකාරී
ජල සම්පත් මණ්ඩලය

පිටපත් :

1. ජනාධිපති ලේකම් : කාරුණික දැනගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් : කාරුණික දැනගැනීම සඳහා
3. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් : දැ.ගැ.ස හා අවශ්‍ය කටයුතු සඳහා
4. සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් : දැ.ගැ.ස හා අවශ්‍ය කටයුතු සඳහා
5. විගණකාධිපති : දැ.ගැ.ස
6. පොලිස්පති : දැ.ගැ.ස හා අවශ්‍ය කටයුතු සඳහා